# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 1929/9 - 2015 අගෝස්තු මස 24 වැනි සඳුදා - 2015.08.24

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

# I වැනි කොටස: (I) වැනි ඡෙදය - සාමාන්‍ය

## රජයේ නිවේදන

එල්.ඩී.බී. 94/47 V

**(269 වන අධිකාරය වූ) නගර හා ග්‍රාම නිර්මාණ ආඥාපනත**

6(2)(ආ) සහ 21(2)(ආ) වගන්ති යටතේ වූ නියමය

(269 වන අධිකාරය වූ) නගර හා ග්‍රාම නිර්මාණ ආඥාපනතේ 6(2)(ආ) වගන්තිය සහ 21(2)(ආ) වගන්තිය මගින් මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර ප්‍රතිපත්ති සම්පාදන, ආර්ථික කටයුතු, ළමා, තරුණ සහ සංස්කෘතික කටයුතු අමාත්‍ය රනිල් වික්‍රමසිංහ වන මා විසින්, මේ නියමය මගින් :

(අ) ඉහත කී ආඥාපනතේ කාර්ය සඳහා මෙහි උපලේඛනයේ නිශ්චිතව දක්වෙන ඉඩම් ප්‍රදේශය නාගරික සංවර්ධන ප්‍රදේශයක් බවටත් එය ''බත්තරමුල්ල බටපොත ශ්‍රී සුදර්ශනාරාම පුරාණ විහාරය පූජා භූමිය'' යනුවෙන් හඳුන්වනු ලැබිය යුතු බවටත් ප්‍රකාශයට පත් කරනු ලැබේ ; සහ

(ආ) ''බත්තරමුල්ල බටපොත ශ්‍රී සුදර්ශනාරාම පුරාණ විහාරය පූජා භූමිය'' වශයෙන් ප්‍රකාශයට පත් කරනු ලැබූ සම්පූර්ණ ප්‍රදේශය සම්බන්ධයෙන් දළ සැලසුම් යෝජනා ක්‍රමයක් සකස් කළ යුතු බවටත් විධාන කරනු ලැබේ.

රනිල් වික්‍රමසිංහ,
ප්‍රතිපත්ති සම්පාදන, ආර්ථික කටයුතු,
ළමා, තරුණ සහ සංස්කෘතික කටයුතු අමාත්‍ය.

2015 ජූලි මස 17 වැනි දින,
කොළඹ 01,
ප්‍රතිපත්ති සම්පාදන, ආර්ථික කටයුතු,
ළමා, තරුණ සහ සංස්කෘතික කටයුතු අමාත්‍යාංශයේ දී ය.



*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය www.documents.gov.lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

### උපලේඛනය

*''බත්තරමුල්ල බටපොත ශ්‍රී සුදර්ශනාරාම පුරාණ විහාරය පූජා භූමිය'' සංයුක්ත වන ප්‍රදේශය*

සර්වේයර් ජනරාල්ගේ 2015 ජනවාරි මස 02 වන දින අංක CO/KDW/2014/870 දරන සැලසුමේ නිරූපිත බස්නාහිර පළාතේ, කොළඹ පරිපාලන දිස්ත්‍රික්කයේ, කඩුවෙල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, තලංගම (දකුණු) ගම, බටපොත ග්‍රාම නිලධාරී වසමේ පිහිටි හෙක්ටයාර් 0.7375, අ. 01, රූ. 03, පර්. 11.59ක් විශාලත්වයෙන් යුක්ත පහත දැක්වෙන පරිදි මායිම් වූ ප්‍රදේශය :-

මායිම් උපලේඛනය

| | | |
|---|---|---|
| උතුරට | : | මාර්ගය (ප්‍රාදේශීය සභාව) ; |
| නැගෙනහිරට | : | නිහාල් විජේසිංහ සහ තවත් අය හිමිකම් කියන හොරොක්ගහවත්ත ; |
| දකුණට | : | රොබට් ගුණවර්ධන මාවත ; |
| බටහිරට | : | රොබට් ගුණවර්ධන මාවත සහ ඊ. ඕ. සමරක්කොඩි අය හිමිකම් කියන ඉඩම. |

09-147

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.